# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
Po.Box No — 10120

ෆැක්ස්
தொலைநகல
Fax — 011-2171635

දුරකථන
தொலைபேசி
Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site — www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail — dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO — 1491/ 2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No — / 2024

දිනය
திக
Date — 20/09/2024
පැය 0935

## මාධ්‍ය නිවේදනය

**වෙඩි තබා පුද්ගලයෙකු ඝාතනය කිරිම - දෙහිවල පොලිස් වසම.**

2024.09.20 වන අද දින උදෑසන කාලයේ දෙහිවල පොලිස් වසමේ නැදිමාල ක්‍රීඩා පිටිය අසලදී යතුරු පැදියකින් පැමිණි නාඳුනන පුද්ගලයින් දෙදෙනෙකු විසින් කළුබෝවිල දෙස සිට දෙහිවල දෙසට ගමන් ගත් යතුරු පැදිකරුවෙකුට වෙඩි තබා පලා ගොස් ඇති බවට දෙහිවල පොලිසියට ලද පණිවිඩයක් අනුව විමර්ශන ආරම්භ කර ඇත. වෙඩි වැදීමෙන් තුවාල ලැබූ පැදිකරු කළුබෝවිල රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදි මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 45 ක් වූ ගුණාලංකාර මාවත, සරණංකර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

2024.09.15 වන දින දෙහිවල පොලිස් වසමේ බඩෝවිට ප්‍රදේශයේදී වෙඩි තබා පුද්ගලයෙකු ඝාතනය කිරීමේ සිද්ධිය හා 2024.09.18 වන දින කොහුවල පොලිස් වසමේ සරණංකර ප්‍රදේශයේ දි පුද්ගලයෙකු වෙඩි තබා ඝාතනය කිරීමේ සිද්ධිය මෙම අපරාධය හා සම්බන්ධතාවයක් ඇති බවට නිරීක්ෂණය වන අතර මෙම මනුෂ්‍ය ඝාතනය මැතිවරණය හා සම්බන්ධතාවයක් දක්වන සිදුවීමක් නොවන බවට මෙතෙක් කරන ලද විමර්ශන වලදි නිරීක්ෂණය වී ඇත. දෙහිවල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**